(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 13(6).]

# පාර්ලිමේන්තුවේ අංක 13 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 පෙබරවාරි මස 23 වැනි සඳුදා**

## 2015 මාර්තු මස 03 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 02 දිනැති අංක 1900/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2015 මාර්තු මස 17 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4530/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආබාධිත රණවිරුවන් ස්වයං රැකියාවලට යොමු කිරීම සඳහා ''රණවිරු දිවි නැගුම'' නමින් විශේෂ ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කළ බව දන්නේද;

(ii) එසේ නම්, එම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙන ස්වයං රැකියා කවරේද;

(iii) ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සඳහා ලබා දෙන අවම සහ උපරිම ණය මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ''රණවිරු දිවි නැගුම'' ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදලක් ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

(ii) ඒ සඳහා ඉටු කළ යුතු ඇප, කොන්දේසි සහ ණය මුදල සඳහා අය කරනු ලබන පොලී අනුපාත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4579/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ කැසිනෝ සූදුව වෙනුවෙන් 2012 සිට මේ දක්වා නිකුත් කර

ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම කැසිනෝශාලා පවත්වාගෙන යනු ලබන ප්‍රදේශ කවරේද;

(iv) මේ වන විට බලපත්‍ර රහිත කැසිනෝශාලා පවත්වාගෙන යනු ලබන බවට වාර්තා වී තිබේද;

(v) එසේ නම්, එම කැසිනෝශාලා සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4785/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) වන අලි තර්ජන ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අලි තර්ජන ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතින වන අලි තර්ජන අවම කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වන අලි තර්ජන අවම කිරීම සඳහා අයවැය මගින් ප්‍රමාණවත් මුදලක් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5020/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ නගරයේ, මහවීදිය, සිරි කුරුස පාර හා මංගල පාර යන එක් එක් මාර්ගය පුළුල් කිරීම සඳහා අවසන් වරට ඉඩම් අත්පත් කර ගත් වර්ෂයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම අත්පත් කර ගත් ඉඩම් සඳහා මේ වන විට වන්දි ගෙවා තිබේ නම්, එම එක් එක් මාර්ගයට අදාළව වන්දි ගෙවන ලද වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයන්හි සංවර්ධන කටයුතු වෙනුවෙන් අත්පත් කර ගත් සියලු ඉඩම් භෞතික වශයෙන් මගී ජනතාවගේ පරිහරණයට යොදවා තිබේද;

(ii) එම මාර්ග සංවර්ධනය වෙනුවෙන් අත්පත් කරගෙන ඇතත්, මෙතෙක් මගී ජනතාවගේ පරිහරණයට යොදා නොගත් ඉඩම් තිබේද;

(iii) එසේ නම්, එවැනි ඉඩම් තිබෙන මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5443/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2009 සිට 2013 දක්වා කාලය තුළ රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකිකයන් අතරින් ගෘහ සේවයේ, කර්මාන්ත ශාලාවල සේවයේ සහ වෙනත් විවිධ රැකියාවන්වල

යෙදී සිටියදී මිය ගිය සංඛ්‍යාව පිළිබඳව මෙම සභාව දැනුවත් කර තිබේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) විදේශ රැකියාවල යෙදී සිටියදී සැක කටයුතු ලෙස මිය ගිය අය පිළිබඳව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5771/’14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල-මාදම්පේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළ මාර්ගයේ දුර ප්‍රමාණය සහ පළල කොපමණද;

(ii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගත වන කාල සීමාව කවරේද;

(iii) එම මාර්ගයේ ඉදිකිරීම්කරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මගින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ/ආයතනයේ නම කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(vi) එම මාර්ගයේ එක් කිලෝමීටරයක් ඉදිකිරීම සඳහා වැය වෙන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන කාලය තුළ රථ වාහන පාලනය සඳහා වැඩ පිළිවෙළක් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, සම්පූර්ණ ව්‍යාපෘතිය තුළින් ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අගතියට පත්වන පාර්ශ්වකරුවන් ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අගතියට පත් අයට වන්දි ප්‍රදානය කර තිබේද;

(iii) එසේ නම්, වන්දි ලබා දුන් අයගේ විස්තර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5856/’15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට රැකියා සඳහා විදේශගත ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිසට අයත් කාන්තාවන්ගේ හා පිරිමින්ගේ ප්‍රතිශතයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉදිරියේදී විදේශගත ශ්‍රමිකයන්ට මතුවන ගැටලු අවම කිරීමට ගනු ලබන කඩිනම් ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4532/’13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 අයවැය මගින් කළ යෝජනාවක් පරිදි ක්‍රියාත්මක වූ ආරක්ෂක අංශ සාමාජිකයින්ගේ පවුල්වල තුන්වැනි දරුවාගේ උපත වෙනුවෙන් රුපියල් ලක්ෂයක දීමනාවක් ලබා දීමේ වැඩපිළිවෙළ මේ වන විටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) තුන්වැනි දරු උපතකට අදාළව ආරක්ෂක අංශ සාමාජිකයෙකු විසින් ඉහත මුදල ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4787/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද්ධය නිම කිරීම සඳහා පොලිස් නිලධාරීන් හා පොලිස් විශේෂ කාර්ය බලකාය ද සම්බන්ධ වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඔවුන් රණවිරුවන් සේ පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රණවිරුවන් දිරිමත් කිරීම සඳහා පවත්වනු ලබන "රණවිරු රියල් ස්ටාර්" තරඟාවලියට පොලිස් නිලධාරීන් සහභාගී කර නොගැනීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5141/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය සඳහා මිනිස්බල සපයන ආයතන හරහා යොදවා සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයින් සේවයේ යොදවා ගෙන සිටින කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂය තුළ දී ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය සඳහා සෘජුවම බඳවා ගත් සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයින් බඳවා ගැනීමේදී පලපුරුදු සේවා කාලයක් සහිත ඉහත (අ) (i) හි සඳහන් සේවකයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) 2014 වර්ෂයේ දී බඳවා ගත් මුළු සේවක සංඛ්‍යාව තුළ අ (i) හි සඳහන් සේවකයින්ගෙන් තේරී පත් වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5566/'14

ගරු අනුර දිසානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට තාර ගෙන්වීමේ බලය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පමණක් හිමිව පැවතියේද;

(ii) එම බලය තවමත් එම සංස්ථාව සතුව පවතින්නේද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අමතරව, වෙනත් සමාගම්වලට තාර ගෙන්වීමට අවසර දී තිබේද;

(iii) එසේ නම්, එම සමාගම් කවරේද;

(iv) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව පැවති එම බලය අහෝසි කළේ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5860/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය යටතේ පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කටයුතු කර ඇති බවත්;

(ii) ඒ යටතේ 2014 වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විශාල මුදලක් සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන්කර තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(ii) හි සඳහන් කටයුතු යටතේ ක්‍රියාත්මක වූ සමහර වැඩ විෂයයන් අවසන් කර ඇති අතර, ඒ සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කර තිබේද;

(ii) අධික වර්ෂාව හේතුවෙන් ඇතැම් වැඩ විෂයයන් අතරමඟ නැවතී ඇති අතර, ඒ වෙනුවෙන් ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4788/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක් වර්ෂයක් තුළ යල සහ මහ කන්න දෙක වගා කිරීම සඳහා අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(ii) දැනට රට තුළ නිෂ්පාදනය කරන බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(iii) අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා බීජ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4820/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතක සිට පිරිවෙන් ගුරුවරුන්ට මැතිවරණ රාජකාරිවල යෙදීම සඳහා අවස්ථාව ලබා නොදීමේ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(ii) 2010 හා 2011 වර්ෂයන්හි පැවති ජාතික මැතිවරණවල රාජකාරි සඳහා පිරිවෙන් ගුරුවරුන්ට අවස්ථාව ලබා නොදීමට හේතු කවරේද;

(iii) ඉදිරි පළාත් පාලන, පළාත් සභා සහ ජාතික මැතිවරණවලදී පිරිවෙන් ගුරුවරුන්ට මැතිවරණ රාජකාරිවල යෙදීමට අවස්ථාව ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5272/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස්පති චක්‍රලේඛ 2416/2013 සහ ආයතන චක්‍රලේඛ 01/2013 යටතේ “2013 පොලිස් නිලධාරීන්ගේ දීමනා වැඩි කිරීමට” යටත් නොවන පොලිස් නිලධාරීන් කොට්ඨාස හෝ නිලධාරීන් සිටින්නේද;

(ii) එසේ නම්, එම පොලිස් නිලධාරී කොට්ඨාසයන් හෝ නිලධාරීන් කවරේද;

(iii) ඉහත චක්‍රලේඛ අනුව එම කොට්ඨාසයේ නිලධාරීන්ගේ දීමනා වැඩි නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා පොලිස් ඉංජිනේරු සේවයෙහි යෙදෙන්නන් පොලිස් නිලධාරීන් ගණයට අයත් නොවන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 මාර්තු මස 18 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4087/’13

ගරු බුද්ධික පතිරණ මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා කාර්යාලයක් පවත්වාගෙන යනු ලබන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම කාර්යාලයේ සේවය කරනු ලබන කාර්යය මණ්ඩල සාමාජිකයින්ගේ නම්, ලිපිනයන්, තනතුරු සහ ඔවුන්ගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් කවරේද;

(ii) එම කාර්යාලය ආරම්භ කළ දින සිට මේ දක්වා එකී කාර්ය මණ්ඩලය සඳහා ගෙවන ලද දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතියේ උපදේශක කාර්යයන් පවරා ඇති ආයතනයේ නම කවරේද;

(ii) එම ව්‍යාපෘතිය වෙනුවෙන් පරිගණක දෘඪාංග මිලදී ගැනීමට මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ මෘදුකාංග සකස් කිරීමේ කටයුතු භාර දී ඇති ආයතනය කවරේද;

(iv) මේ දක්වා මෘදුකාංග සකස් කිරීම වෙනුවෙන් එම ආයතනයට ගෙවා ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4573/’13

ගරු අනුර දිසානායක මහතා,— සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකාවේ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වෙනුවෙන් වාර්ෂිකව අවශ්‍යවන දියර කිරි ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනික කිරිපිටි කිලෝග්‍රෑම් 01ක් වෙනුවෙන් අය කරනු ලබන මුදල කොපමණද;

(ii) එම මුදල, ආනයනික කිරිපිටි දේශීය වෙළඳපොළේ අලෙවි කරනු ලබන මිලෙහි ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4755/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති සමස්ත පොල් වතු සංඛ්‍යාව කොපමණද;

(ii) 2005 වර්ෂයේ සිට 2013 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල් නිෂ්පාදනය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5023/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ දුම්රිය ස්ථානයේ සංවර්ධන කටයුතු සිදුකරනු ලබන කොන්ත්‍රාත් ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනය තෝරා ගනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ආයතනය සිදු කරන ඉහත සඳහන් දුම්රිය ස්ථානයේ සංවර්ධනය සඳහා වූ යෝජිත සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(ii) එම සංවර්ධන කටයුතු සඳහා වැය වන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5198/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා මිරර් (Sri Lanka Mirror) නමැති වෙබ් අඩවිය එවකට ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලියාපදිංචි කර තිබුනේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම ලියාපදිංචිය සඳහා අය කරන ලද ගාස්තු කවරේද;

(iv) නියමිත පරිදි ලියාපදිංචි කර තිබූ එම වෙබ් අඩවිය පවත්වාගෙන ගිය ස්ථානය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කර,

එහි තිබූ පරිගණක ඔවුන්ගේ භාරයට ගෙන තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඉහත ක්‍රියා කලාපයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මූලික අයිතිවාසිකම් නඩු 2කට අදාළව ලබා දී ඇති තීන්දුවකට අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ගත් පරිගණක ශ්‍රී ලංකා මිරර් ආයතනයට ආපසු භාර දී තිබේද;

(ii) අමාත්‍යාංශයේ ලියාපදිංචි පුවත් වෙබ් අඩවියකට අන්තර්ජාල පහසුකම් සපයන ආයතනවල සේවා අඩාලවීම නිරන්තරවම සිදු වන්නේ නම්, අමාත්‍යාංශයට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5416/’14

ගරු අජිත් කුමාර මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ පුද්ගලික අංශය හා රජය මගින් පවත්වාගෙන යන රථ ගාල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

යන්න පළාත් පාලන ආයතන මට්ටමින් එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) රජයේ ඉඩම් රථ ගාල් පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික අංශයට ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(ii) වර්ෂ 2011 - 2013 කාල පරිච්ඡේදය තුළ එසේ බදු දීමෙන් ලැබූ ආදායම කොපමණද;

(iii) එම රථ ගාල්වල එක් එක් වාහන වර්ගය අනුව අය කරනු ලබන ගාස්තු කවරේද;

(iv) ගාස්තුව තීරණය කිරීමේ නිර්ණායක කවරේද;

(v) එම නිර්ණායක සකස් කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රථ ගාල් නඩත්තු කරන ආයතනය සහ අදාළ වැය ශීර්ෂය කවරේද;

(ii) රථ ගාල්වලට සිදුවන අලාභහානි ඒවා ලබාගෙන ඇති පාර්ශ්වයන්ගෙන් පියවා ගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රජයේ ඉඩම් පුද්ගලික අංශය වෙත පවරාදීමේ අරමුණ කවරේද;

(ii) රජය විසින් රථ ගාල් පවත්වාගෙන යාමේ වගකීම නොදරන්නේ මන්ද;

(iii) රජය විසින් මහජන රථ ගාල් පවත්වාගෙනයාමේ ඉදිරි සැලසුමක් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5657/’14

ගරු විජිත හේරත් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ පළමුවැනි උපලේඛනයේ 'අ' පරිශිෂ්ටයේ සඳහන් ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියට අදාළවන තනතුරුවලින් දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම ලැයිස්තුවේ සඳහන් ඉහත ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරුවල පත්කිරීම් බලධරයා කවුරුන්ද;

(iii) ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත්කිරීමේ පටිපාටිය කවරේද;

(iv) ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියට අදාළ තනතුරු සඳහා මේ වන විට පත්කර ඇති ශ්‍රී.ලං.ප.සේ. නොවන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) 2012.07.02 දින සිට 2014.01.01 දින දක්වා වූ කාලය තුළ පුරප්පාඩු වී තිබූ ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරු පැවති ආයතන, එම තනතුරු නාම සහ තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී.ලං.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා 2014 අගෝස්තු මස පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද, සුදුසුකම් සම්පූර්ණ කර තිබූ එක් එක් නිලධාරියාගේ නම, ඔවුන් ශ්‍රී.ලං.ප.සේ. I ශ්‍රේණියට පත් වූ දිනය, පශ්චාත් උපාධිය වලංගු දිනය, එම උපාධිය පිරිනැමූ විශ්වවිද්‍යාලය හා එම උපාධියේ විෂය ක්ෂේත්‍රය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5857/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රජාතන්ත්‍රවාදී රටක මාධ්‍ය නිදහස පැවතිය යුතු බවත්;

(ii) මෙරට මාධ්‍යවේදීන් විසින් සුවිසල් ජන මෙහෙවරක් ඉටුකරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය කාලය තුළ දී අතුරුදහන් වූ හෝ බලපෑම් නිසා විදේශගත වූ ජනමාධ්‍යවේදීන් සිටින්නේද;

(ii) එසේ නම්, එම ජනමාධ්‍යවේදීන්ගේ නම් කවරේද;

(iii) එකී ජනමාධ්‍යවේදීන් සොයා ගැනීමට හෝ නැවත මෙරටට ගෙන්වා ගැනීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4088/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) දිවයින පුරා පිහිටි තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා ගිවිසුම ඇති කර ගන්නා ලද ආයතනයේ නම කවරේද;

(iii) එම ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලැබුවේද;

(iv) අදාළ ගිවිසුමෙහි පිටපතක් මෙම සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේද;

(v) එම ගිවිසුම අත්සන් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ කාල සීමාව කොපමණද;

(iii) ජාලගත කරන ලද තැපැල් කාර්යාල සංඛ්‍යාව අදියරෙන් අදියර, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4769/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ස්ථිර සේවයේ යෙදී සිටින උප තැපැල් ස්ථානාධිපතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය සේවකයන්ට හිමි වරප්‍රසාද උප තැපැල් ස්ථානාධිපතිවරුන්ට ද ලබා දෙන්නේද;

(iii) සෙනසුරාදා දින රාජකාරී කිරීම වෙනුවෙන් උප තැපැල් ස්ථානාධිපතිවරුන්ට අමතර දීමනාවක් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5143/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රාජ්‍ය සේවකයන් විශ්‍රාම ගොස් වසරක් ගත වන තෙක්ම විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ලබා ගැනීමට නොහැකි වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ගෙවන ලද පාරිතෝෂික මුදල බැංකුව මගින් ගෙවීමට කටයුතු කිරීමට හේතු කවරේද;

(ii) විශ්‍රාමිකයා බැංකුවෙන් තම පාරිතෝෂිකය ලබා ගැනීමේදී, ලැබෙන පාරිතෝෂික මුදලින් නැවත අය කර ගනු ලබන ප්‍රතිශතය කොපමණද;

(iii) එම අය කිරීම සිදු කරනු ලබන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පාරිතෝෂිකය නොගෙවූ විශ්‍රාමිකයින්ට අදාළ පාරිතෝෂික ගෙවන ලද සේ සලකා බැංකු විසින් වාරික මුදල් අය කර ගෙන තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ගිය සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5420/'14

ගරු අජිත් කුමාර මහතා,— වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, කුඹුක්කන් ඔය හරස් කර අක්කර 800ක ජලාශයක් ඉදිකිරීමට කටයුතු යොදා ඇති බවත්;

(ii) එම ජලාශය ඉදිකිරීම හේතුවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ ගම්මිරිස් හා රබර් වගාවට දැවැන්ත බලපෑමක් සිදු වන බවත්;

(iii) එම නිසා එම ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික ක්‍රියාවලිය ඇන හිටින බවත්;

(iv) ජලාශය ඉදිකිරීම නිසා ප්‍රදේශයේ දැවැන්ත වන හානියක් හා පරිසර හානියක් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ජල යෝජනාක්‍රමයේ අපේක්ෂිත අරමුණු හා ඉලක්ක කවරේද;

(ii) එම ජලාශය ඉදිකිරීමෙන් ලබා කර ගැනීමට අපේක්ෂිත සංවර්ධනය කවරේද;

(iii) මෙම යෝජනාක්‍රමය සඳහා වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4397/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන විද්‍යා පීඨවල පුහුණුව ලබන අභ්‍යාසලාභියෙකු සඳහා මාසිකව ගෙවනු ලබන මුදල කොපමණද;

(ii) එම මුදල ගෙවීම ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම මුදල ගෙවීම ආරම්භ කිරීමට පෙර ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාවාසික කාලය තුළදී අධ්‍යාපන විද්‍යා පීඨ ගුරු අභ්‍යාසලාභියෙකුට වැටුප් හෝ දීමනා ලෙස ගෙවනු ලබන මුදල කොපමණද;

(ii) එම මුදල ගෙවීමට පෙර ගෙවන ලද මුදල කොපමණද;

(iii) වර්තමාන ජීවන වියදම හා සැසඳීමේදී දැනට ගෙවනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, දැනට ඔවුන්ට ගෙවනු ලබන වැටුප හෝ දීමනා වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4772/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ සහ පෞද්ගලික බස් රථ සඳහා ඒකාබද්ධ කාල සටහන් ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) ශ්‍රී ලංගම බස් රථ සංඛ්‍යාව පෞද්ගලික බස් රථ සංඛ්‍යාවට වඩා අඩු බැවින් එම ඒකාබද්ධ කාල සටහන් ක්‍රමය මගින් බරපතල අලාභයක් ශ්‍රී ලංගමයට සිදුවන්නේද;

(iii) එසේ නම්, ශ්‍රී ලංගමයට සිදුවන එම අලාභය වළක්වා ගැනීම සඳහා යම් ක්‍රියා මාර්ගයක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5336/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂය තුළ දී මාස දෙකකට වැඩි කාල සීමාවකට අදාළව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින් හට මුළු මාසික වැටුප් නොගෙවූ බස් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් ඩිපෝවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංගම සේවකයන්ගේ පාරිතෝෂික දීමනාව අවසන් වරට ගෙවා ඇත්තේ කුමන කාලයක ඉල්ලුම් කළ සේවකයින් සඳහාද;

(ii) 2014 ජුලි මස 31 වැනි දින වන විට පාරිතෝෂික සඳහා ඉල්ලුම් කර ඇති නමුත් මෙතෙක් එය ලබා ගැනීමට නොහැකි වූ ශ්‍රී ලංගම විශ්‍රාමික සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට පාරිතෝෂික ගෙවීම සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(iv) එම මුදල සපයා ගැනීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 මාර්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4323/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මොල්ලිකුලම් - සිලාවතුර මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය බොරලු ලබා ගැනීමට මහා පරිමාණයේ බොරලු කැපීමක් විල්පත්තු ජාතික වනෝද්‍යානයේ, කලාප අංක 4 ට අයත් බොරලුවල ප්‍රදේශයේ සිදු කරන බවත්;

(ii) තන්තිරිමලේ වන අඩවි කාර්යාලයේ අඩවි ආරක්ෂක නිලධාරියාගේ අනුග්‍රහය මේ සඳහා ලැබෙන බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1937 අංක 02 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 3, 5, 6 වගන්ති සියල්ලම ඉහත (අ) (i)හි සඳහන් ක්‍රියාව නිසා උල්ලංඝනය වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මාග ඉංජිනේරු පුද්ගලික සමාගමට ඉහත ප්‍රදේශයේ බොරලු කැපීම සඳහා නිර්දේශ ලබා දුන් අය කවුරුන්ද;

(iii) විල්පත්තු ජාතික වනෝද්‍යානයේ පරිසරයට විශාල හානියක් වන එම ක්‍රියාවලිය වහාම නතර කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4789/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීමේ ක්‍රමවේදය කුමක්ද;

(iv) සංස්කෘතික මධ්‍යස්ථාන භාර නිලධාරීන්ට ගෙවනු ලබන දීමනාව කොපමණද;

(v) එම දීමනාව වැඩි කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5337/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය තුළදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) සතු වූ ධාවනයට සුදුසු මුළු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම වර්ෂය තුළදී ධාවනයට නුසුදුසුයැයි ධාවනයෙන් ඉවත් කර ඇති ශ්‍රී ලංගම බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ ශ්‍රී ලංගම නමින් ධාවනයට යොදවා ඇති පුද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ යොදවා ඇති ගමනාන්තයන් කවරේද;

(iii) එම බස් රථ ශ්‍රී ලංගමයට එක් කර ගැනීමට අනුගමනය කළ අනුමත කරන ලද ක්‍රමවේදය කවරේද;

(iv) එම බස් රථ මගින් ශ්‍රී ලංගමයට ආදායම ලබා ගන්නා ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5862/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග පද්ධතියේ ඇති දියුණුව අප රටේ සංවර්ධනයට බලපාන ප්‍රධාන සාධකයක් වන බවත්;

(ii) පසුගිය වර්ෂ කිහිපය තුළ මෙරට මාර්ග සංවර්ධන කටයුතු රැසක් සිදු වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ වන විට අතරමග නැවතී ඇති මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4473/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාතර, උයන්වත්ත ක්‍රීඩාංගනය දිස්ත්‍රික් සහ සමස්ත ලංකා මට්ටමේ ක්‍රීඩා තරග පැවැත්වීමට යොදා ගන්නා පොදු ක්‍රීඩාංගනයක් බවත්;

(ii) මාතර නගරවාසීන් බොහෝ පිරිසක් දෛනිකව ශාරීරික සුවතා සඳහා එම ක්‍රීඩාංගනය භාවිතා කරන බවත්;

(iii) මාතර මහ නගර සභාව මගින් එම ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විකිණීම සඳහා කටයුතු කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විකුණනු ලැබුවහොත්, එම ප්‍රදේශයේ ජනතාවට අපහසුතා රැසකට මුහුණදීමට සිදු වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එකී ක්‍රීඩාංගනය විකිණීමේ ක්‍රියාවලිය නවතාලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4790/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේද;

(ii) මේ දක්වා පිහිටුවා ඇති ග්‍රාමීය වැඩිහිටි කමිටු සංඛ්‍යාව කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ග්‍රාමීය වැඩිහිටි කමිටු සංඛ්‍යාව කොපමණද;

(iv) එම වැඩිහිටි කමිටු සඳහා රජයෙන් ප්‍රතිපාදන සහ භෞතික සම්පත් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5434/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් තම නිෂ්පාදනවලට අදාළ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම සඳහා ට්‍රැඩ් ලංකා පුද්ගලික සමාගම වෙත කොන්ත්‍රාත්තුවක් ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම කොන්ත්‍රාත්තුවේ වටිනාකම කොපමණද;

(iii) එම ආයතනය වෙත එකී කොන්ත්‍රාත්තුව ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේද;

(iv) ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන හා අදාළ මිල ගණන් කවරේද;

(v) එම මිල ගණන් කැඳවීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කුමන අංශයේ කුමන නිලධාරියා විසින් සිදු කරනු ලැබුවේද;

(vi) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුළ එසේ කටයුතු කිරීම සඳහා ඔවුන්ට නීත්‍යානුකූල බලයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අ (i) හි සඳහන් කොන්ත්‍රාත්තුව ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලබා දී තිබේ නම්, එම ආයතනය තෝරා ගත් පදනම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4791/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි වී ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිටින පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාලිකාවන් සඳහා දීමනා ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4821/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ දී හම්බන්තොට දී පැවැත්වීමට යෝජිත කණිෂ්ඨ ආසියානු ක්‍රීඩා උළෙල (Junior Asian Games) වෙනුවෙන් සිදු කරන නව ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ සඳහා ඇස්තමේන්තුගත සමස්ත වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ) (i) හි සඳහන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා අයදුම් කළ ආයතනයන්හි නම්, ලිපිනයන් හා දුරකතන අංක වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ)හි සඳහන් ආයතන අතරින් ඉදිකිරීම් කටයුතු සඳහා තෝරා ගත් ආයතනය කවරේද;

(ii) එම ආයතනය තෝරා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5435/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 ජනවාරි සිට ජුනි දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දේශීය සැපයුම්කරුවන්ගෙන් මිල දී ගෙන ඇති තාර බැරල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තාර ප්‍රමාණය මිල දී ගැනීමට වැය කළ මුදල කොපමණද;

(iii) එම තාර බැරල් සියල්ල අලෙවි කිරීමට සුදුසු තත්ත්වයෙන් පැවතියේද;

(iv) නොඑසේ නම්, අලෙවි කිරීමට සුදුසු තත්ත්වයේ තිබූ තාර බැරල් සංඛ්‍යාව කොපමණද;

(v) එම තාර බැරල් විකිණීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් තාර සැපයූ ආයතනය තෝරා ගැනීමට අනුගමනය කළ පිළිගත් ක්‍රමවේදය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා තාර බැරල් අලෙවි කිරීමට අදාළව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මේ දක්වා අයවීමට ඇති මුදල කොපමණද;

(ii) අය විය යුතු එම මුදල් ප්‍රමාණය එක් එක් ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 මාර්තු මස 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4792/’14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1994, 2005 සහ 2013 වන විට මෙරට තිබූ ඇඟලුම් කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2013 දක්වා කාල සීමාව තුළ දී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබූ ඇඟලුම් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) ආයෝජන ප්‍රවර්ධන කලාපවල පිහිටා තිබෙන ඇඟලුම් කර්මාන්තශාලාවල සේවකයන්ගේ සුබසාධනය සඳහා රජය විසින් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?ක

4822/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ පිහිටා ඇති කඩ කාමර හා රථ ගාල ගැණුම්කරුවන්ට ලබාදීමේදී ටෙන්ඩර කැඳවීමක් සිදු කළේද;

(ii) ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකළේ නම්, ඒවා ලබාදුන් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පරිදි ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ අයගේ නම්, ලිපිනයන් සහ එක් එක් ටෙන්ඩර් ඉල්ලුම්පතෙහි සඳහන් මුදල වෙන් වෙන් වශයෙන් ඇතුළත් ලේඛනයක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයේ පිහිටි කඩ කාමර සහ රථ ගාලෙහි වර්තමාන හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම එක් එක් පුද්ගලයා විසින් එම කඩ කාමර සහ රථ ගාල ලබාගෙන ඇති මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5436/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තය සතු මුතුරාජවෙල ටැංකි සංකීර්ණය සඳහා ආනයනය කළ ඩීසල්වල ගෙන්දගම් ප්‍රතිශතය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඉන්ධන පිරවුම්හල්වල විකිණීමට ඇති ලංකා ඔටෝ ඩීසල් සහ සුපර් ඩීසල්වල ඇති ගෙන්දගම් ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති ඉන්ධන පිරවුම්හල්වලට ලංකා ඔටෝ ඩීසල් හා සුපර් ඩීසල් ලබා දෙන්නේ කුමන ඛනිජ තෙල් ගබඩා පර්යන්තයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5863/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට සමෘද්ධි සහනාධාර ලබා දෙන අඩු ආදායම්ලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් පවුලක් වෙනුවෙන් ලබා දෙන සහනාධාරවල වටිනාකම කොපමණද;

(iii) 2015 වර්ෂයේ දී එම මුදල ඉහළ දැමීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ අනුව වැඩි කරනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4793/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ ලියාපදිංචි සමස්ත උපාධිධාරීන් අතරින් බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව හා අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂයක් තුළ දී රජයේ විශ්ව විද්‍යාල සඳහා ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) අ.පො.ස (උ.පෙ.) විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ දින සිට විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම දක්වා ගත වන කාල සීමාව කොපමණද;

(iv) මේ වන විට එම කාල සීමාව වර්ෂයකට ද වැඩි කාල සීමාවක් බවට පත්ව ඇති බව දන්නේද;

(v) එම තත්ත්වයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අ.පො.ස (උ.පෙ) විභාගයේ ප්‍රතිඵල නිකුත්කිරීමෙන් පසු ඉතා ඉක්මනින් විශ්වවිද්‍යාල සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4823/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත් වායු සමනය කළ සුඛෝපභෝගී වාහන නාවික හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත් සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5864/'15

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට රට තුළ ස්ථාපිත කර ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම පොලිස් ස්ථානවල අඩුපාඩු රැසක් පවතින බවත්;

(ii) අලව්ව පොලිස් ස්ථානයද නවීකරණයට ලක් කළ යුතුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) අඩුපාඩු සහිත පොලිස් ස්ථාන නවීකරණය කිරීමට හෝ අලුතින් ඉදිකිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?